# ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරී කණ්ඩායම සිය සංචාරය අවසන් කරයි 2022 ජූනි 30 දින

සාමාජික රටක සංචාරය අවසන් කිරීමෙන් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) දූත මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන මූලික නිරීක්ෂණ, එම දූත මණ්ඩල සංචාරය අවසානයේ නිකුත් කෙරෙන පුවත්පත් නිවේදන තුළ අන්තර්ගත වේ. මෙම ප්‍රකාශනයෙහි ඇති අදහස් ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායමේ අදහස් වන අතර, එමගින් ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ මතය අත්‍යවශ්‍යයෙන්ම පිළිබිඹු නොවේ.

- ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමක් මගින් සහාය වන ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ පිළිබඳව අදාළ බලධාරීන් සමඟ ජා.මූ. අරමුදලේ කණ්ඩායම සාර්ථක හා ඵලදායී සාකච්ඡා පවත්වන ලදී.
- විස්තීර්ණ ණය පහසුකම පිළිබඳ නිලධාරී මට්ටමේ එකඟතාවකට නුදුරේදී එළඹීම සඳහා සිදුකළ සාකච්ඡාවල සැලකිය යුතු ප්‍රගතියක් ඇතිවූ අතර එම සාකච්ඡා ඉදිරියේදී මාර්ගගත ක්‍රමය යටතේ අඛණ්ඩව සිදුකරනු ඇත.
- සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය නැවත ස්ථාපිත කරන අතර, දිළිඳු හා අවදානමට ලක්විය හැකි අය ආරක්ෂා කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ දූෂණ අවදානම් වැළැක්වීය සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කිරීම සහ ශ්‍රී ලංකාවේ වර්ධන විභවය අත්කර ගැනීම, ජා.මූ. අරමුදලේ නව වැඩසටහනේ පරමාර්ථ වනු ඇත.

පීටර් බෲවර් (Peter Breuer) සහ මසහිරෝ නොසාකි (Masahiro Nizaki) යන මහත්වරුන්ගේ නායකත්වයෙන් යුත් ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට ජා.මූ. අරමුදලේ සහාය ලබාදීමට සහ බලධාරීන්ගේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන පිළිබඳ සාකච්ඡා කිරීමට 2022 වසරේ ජූනි 20 සිට 30 දක්වා කාලය තුළදී කොළඹට පැමිණියහ. ජා.මූ. අරමුදලහි ආසියා සහ පැසිෆික් කලාපීය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඈන්-මරී ගුල්ඩේ-වුල්ෆ් (Anne-Marie Gulde-Wolf) මහත්මිය ප්‍රතිපත්ති සාකච්ඡාවලට සහභාගී විය.

දූත මණ්ඩලයේ සංචාරය අවසානයේදී බෲවර් සහ නොසාකි මහත්වරුන් විසින් පහත සඳහන් ප්‍රකාශය නිකුත් කරන ලදී:

“ශ්‍රී ලංකාව දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටී. ශ්‍රී ලංකා ආර්ථිකය 2022 වසරේදී සැලකිය යුතු ලෙස සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර උද්ධමනය වැඩි මට්ටමක පවතින අතර එය ඉහළ යමින් පවතී. ජාත්‍යන්තර

සංචිත ඉතා පහළ මට්ටමක පැවතීම නිසා අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා අහිතකර බලපෑම් සිදුකර ඇත. රටට පැමිණ සිදු කළ මෙම සංචාරයේදී, නිලධාරී කණ්ඩායම ශ්‍රී ලංකාවේ ජනතාව දැනට මුහුණ පා ඇති දුෂ්කරතා නිරීක්ෂණය කළ අතර විශේෂයෙන් දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාව මෙම අර්බුදයෙන් අසමාන ලෙස බලපෑමකට ලක් වී ඇති බවත් නිරීක්ෂණය කරන ලදී. ජා.මූ. අරමුදලේ ප්‍රතිපත්ති වලට අනුව ශ්‍රී ලංකාවට සහාය වීමට මෙම දුෂ්කර කාලයේදී අපේ කැපවීම අපි නැවත තහවුරු කරන්නෙමු.

"අප්‍රේල් මස මුල සිට බලධාරීන් ක්‍රියාත්මක කළ මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අනෙකුත් ක්‍රියාමාර්ග මෙම අර්බුදයට පිළියම් ලෙස තැබූ වැදගත් පළමු පියවරයන් විය. නිලධාරී කණ්ඩායම ශ්‍රී ලංකා බලධාරීන් සමඟ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම ආධාරයෙන් සිදු කරන ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ පිළිබඳ සාර්ථක සහ ඵලදායී සාකච්ඡා සිදු කරන ලදී. නිලධාරී කණ්ඩායම සහ බලධාරීන් සාර්ව ආර්ථික සහ ව්‍යුහාත්මක ප්‍රතිපත්ති පැකේජය තීරණය කිරීම පිළිබඳ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය. විස්තීර්ණ ණය පහසුකම සම්බන්ධයෙන් නුදුරේදීම නිලධාරී මට්ටමේ එකඟතාවකට එළඹීම අරමුණු කර ගනිමින් සාකච්ඡා ඉදිරියේදී මාර්ගගත ක්‍රමය යටතේ අඛණ්ඩව සිදු කරනු ඇත. රජයේ ණය තිරසාර නොවන බවට තක්සේරු කර ඇති නිසා විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ණය තිරසාරභාවය නැවත ස්ථාපිත කර ගැනීමට ශ්‍රී ලංකාවේ ණය හිමියන්ගෙන් ප්‍රමාණවත් මූල්‍යනයන් පිළිබද සහතිකයන් අවශ්‍ය වේ.

"මෙම පසුබිම තුළ, සාර්ව ආර්ථික අසමතුලිතතා නිවැරදි කිරීම, රාජ්‍ය ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සහ ශ්‍රී ලංකාව ආර්ථික වර්ධනයේ විභව මට්ටම වෙත ළඟා වීම සඳහා පුළුල් ආර්ථික වැඩසටහනක් සැලසුම් කිරීම පිළිබඳව සාකච්ඡාවන්හිදී අවධානය යොමු විය. දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාව සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සහතික කරන අතරම, ඉහළ ගිය රාජ්‍ය මූල්‍ය හිඟය අඩු කිරීමේ අවශ්‍යතාවය ඇතුළුව, සංචාරය අතරතුර සාකච්ඡා සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය. ආදායම් අඩු මට්ටමක පවතින බැවින්, මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් ප්‍රතිඵල ඇති වන බදු ප්‍රතිසංස්කරණ කඩිනමින් අවශ්‍ය වේ. විසඳුම් සෙවීමට අවශ්‍ය අනෙකුත් අභියෝග අතරට, උද්ධමනය ඉහළ යාම, දැඩි ගෙවුම් තුලන පීඩනය අවම කිරීම, දූෂණ අවදානම් අවම කිරීම සහ ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීම වෙනුවෙන් වන ප්‍රතිසංස්කරණ ඇතුළත් වේ. බලධාරීන් ඔවුන්ගේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සකස් කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර ඔවුන් සමඟ සාකච්ඡා අඛණ්ඩව සිදු කරගෙන යාමට අපි බලාපොරොත්තු වෙමු.

“ජා.මූ. අරමුදලේ දූත පිරිස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ, භාණ්ඩාගාර ලේකම් කේ.එම්. මහින්ද සිරිවර්ධන යන මහත්වරුන් සහ, රජයේ සහ මහ බැංකුවේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්විය. තවද, ඔවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෞද්ගලික අංශය, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන පාර්ශ්වකරුවන් ද හමු විය.

“බලධාරීන්ගේ අවංක ප්‍රවේශය සහ උණුසුම් ආගන්තුක සත්කාර වෙනුවෙන් ඔවුන්ට ස්තූති කරන අතර, ශ්‍රී ලංකාවට සහ එහි ජනතාවට සහාය දැක්වීම සඳහා අපගේ සාකච්ඡා අඛණ්ඩව පවත්වාගෙන යෑමට ඉතා ඕනෑකමින් බලාපොරොත්තුවෙන් සිටිමු.”